# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
# புவிச்சரிதவியல் அளவை சுரங்கங்கள் பணியகம்
# GEOLOGICAL SURVEY & MINES BUREAU

නො. 569, එපිටමුල්ල පාර,
පිටකෝට්ටේ, ශ්‍රී ලංකා.

இல. 569, எப்பிட்டமுல்ல வீதி,
பிடகோட்டே, இலங்கை.

No. 569, EPITAMULLA ROAD,
PITAKOTTE, SRI LANKA.


2025.09.17

ප.ව. 12.15 ට

**නිවේදන අංක : GSMB/Press Release/2025/01**

**<u>මාධ්‍ය නිවේදනය</u>**

**<u>පාසල් පැවැත්වෙන දිනයන් හි දී පෙ.ව. 06.30 සිට පෙ.ව. 07.45 දක්වා සහ පෙ.ව. 11.30 සිට ප.ව. 02.30 දක්වා කාලය තුළ ඛනිජ ප්‍රවාහන කටයුතු සිදු කිරීම අත්හිටුවීම සම්බන්ධයෙන් පනවන ලද නව කොන්දේසිය සංශෝධනය කිරීම.</u>**

ඛනිජ ප්‍රවාහනයේ දී අපරික්ෂාකාරී ලෙස වාහන ධාවනය කිරීම හේතුවෙන් පාසල් සිසුන් රැගත් වාහන අනතුරු වලට ලක්වීම වර්තමානයේ බහුලව සිදුවන බවට නිරීක්ෂණය වූ බැවින් ද, පරිසර අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව ද, 2025.09.04 දින සිට පාසල් පැවැත්වෙන දිනයන් හි දී පෙ.ව. 06.30 සිට පෙ.ව. 07.45 දක්වා සහ පෙ.ව. 11.30 සිට ප.ව. 02.30 දක්වා කාලසීමාවන් තුළ, පාසල් අසළ හා සිසුන් පාර මාරුවන ස්ථාන අසළින් ඛනිජ ප්‍රවාහන කටයුතු (කළුගල් ඇතුළුව) සිදු නොකරන ලෙසට පනවන ලද නව කොන්දේසිය, ඉදිකිරීම් කර්මාන්තයට අදාළව දහවල් කාලයේ දී ඛනිජ ප්‍රවාහනයට ඇතිවන දැඩි බලපෑම මත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින කර්මාන්තකරුවන් සිදු කරනු ලබන බලවත් ඉල්ලීම සැළකිල්ලට ගෙන, ඔවුන්ට ඇතිවන අපහසුතාවයන් සළකා බලා සංශෝධනය කිරීමට තීරණය කොට ඇත.

ඒ අනුව, ඉහත කාලසීමාවන් තුළ දී පාසල් අසළ හා සිසුන් පාර මාරුවන ස්ථාන අසළ ඛනිජ ප්‍රවාහන කටයුතු සිදු කිරීම, වාහන වල වේගය සීමාවීමකින් යුතුව පොලිස් නිලධාරීන්ගේ දැඩි අධීක්ෂණය යටතේ සිදු කළ යුතු වේ.

එබැවින්, 2025.09.17 දින සිට පාසල් පැවැත්වෙන දිනයන් හි දී පෙ.ව. 06.30 සිට පෙ.ව. 07.45 දක්වා සහ පෙ.ව. 11.30 සිට ප.ව. 02.30 දක්වා කාලසීමාවන් තුළ ඛනිජ ප්‍රවාහනයේ යෙදීම නව කොන්දේසි සංශෝධනය අනුව සිදු කළ යුතු බව ප්‍රකාශ කරමු.

**සභාපති**
**ජේ.එම්.එස්.එන්. ජයසිංහ**

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

පිටපත් :

01. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මූලස්ථානය, කොළඹ 02. (ඉහත කරුණ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරුන් හරහා සියළුම පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම සඳහා)
02. ලේකම්, පරිසර අමාත්‍යාංශය, "සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල. (ඔබගේ උපදෙස් පරිදි)
03. ප්‍රධාන ලිපිගොනුව

DG-DPRW/Dinu
D/Dinu/2025/Press Release/12.09.2025


| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | සභාපති / தலைவர் / Chairman : 2886268 | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General : 2886271 | පොදු / பொது / General : 2886289, 2886290, 2887820, 2887821, 2887822, 2887823 | ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No. | 94-011-2886276 |

E-mail : info@gsmb.gov.lk WEB SITE : http://www.gsmb.gov.lk